(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(17).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 අගෝස්තු 09 සිකුරාදා**

---

**2024 අගෝස්තු 21 බදාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජුනි 18 දිනැති අංක 2389/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග,— 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 19(2) වගන්තිය සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 15 දිනැති අංක 2393/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2024 අගෝස්තු 21 බදාදා)**

2152/2024

ගරු එරාන් වික්‍රමරත්න මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත, බුද්ධිමය දේපළ පනත සහ සී/ස ආශා මිනරල්ස් පුද්ගලික සමාගමට බොහෝ කලකට පෙර සිටම අවශ්‍ය බලපත්‍ර හිමිකාරිත්වය දැරූ සී/ස පුත්තලම ඉල්මනයිට් සමාගමෙහි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින්, ගවේෂණය හා සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් සී/ස ආශා මිනරල්ස් පුද්ගලික සමාගම සමඟ ගිවිසුමකට එළඹීමට පාදක වූ හේතු සහ ක්‍රමවේද කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කර්මාන්ත අමාත්‍යාංශයේ 2023.05.23 දිනැති ලිපිය සම්බන්ධයෙන් පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) සී/ස පුත්තලම ඉල්මනයිට් සමාගම විසින් 2023.10.19 දින මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයේ ප්‍රතිඵලය කවරේද;

(iii) මුදල් අමාත්‍යාංශය විසින් පිළිවෙළින් 2024.01.30 සහ 2024.03.11 යන දිනයන්හිදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත ලබා දුන් උපදෙස් පිළිනොපැදීමට හේතු කවරේද;

(iv) රේඛීය අමාත්‍යාංශය සහ එකම කොටස් හිමියා වන භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත සිය අනුකූලතාවය බලාත්මක කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 සැප්තැම්බර් 03 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1157/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සාමාන්‍යයෙන් එක් වර්ෂයක් තුළ උසස් අධ්‍යාපන කටයුතු සඳහා විදේශගත වන ශ්‍රී ලාංකික සිසුන් සංඛ්‍යාව සහ ඒ සඳහා වැය වන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් විදේශගත වන රටවල් කවරේද;

(iii) එම සිසුන් හදාරනු ලබන උපාධි පාඨමාලා කවරේද;

(iv) එම උපාධි පාඨමාලා ශ්‍රී ලංකාවේදී හැදෑරිය නොහැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1249/2024

ගරු එරාන් වික්‍රමරත්න මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ලබා දී ඇති GSP+ සහනය අනුව ශ්‍රී ලංකාව විසින් සේවක අයිතිවාසිකම් සහ ආරක්ෂාව සම්බන්ධ විධිවිධාන කිහිපයක් ක්‍රියාත්මක කළ යුතු බව දන්නේද;

(ii) එසේ නම්, සේවක අයිතිවාසිකම් සුරැකීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එවැනි කිසිදු පියවරක් මේ වනතෙක් ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවකයින් සඳහා නිසි ආරක්ෂිත ක්‍රියාමාර්ග නොමැති බව සහ ඇතැම් ඇඟලුම් ආයතන විසින් සේවකයින් සඳහා ආහාර පාන සැපයීම නවත්වා ඇති බවත්;

(ii) ඇඟලුම් කම්හල් තුළ සේවක සේවිකාවන් අතර සාමූහිකව කටයුතු කිරීම තහනම් කර තිබීම කාන්තා හා පිරිමි සියලු සේවකයන් කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කර ඇති අතර, විශේෂයෙන්ම එය වැඩ බිම තුළ ලිංගික හිංසනයට ලක්වන සේවිකාවන්ට බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවකයින් රැක ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) සේවක අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සඳහා අදාළ සේවායෝජකයින් වෙත වගවීමක් ඇති කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා වැඩිදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1255/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බහාලුම් හැසිරවීම ඇතුළු කොළඹ වරායේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන පර්යන්ත සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් පර්යන්තයේ හිමිකාරිත්වය දරන ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 වර්ෂයේ සිට මේ දක්වා එම එක් එක් පර්යන්තය මඟින් මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව සහ උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආදායමෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිමිවූ ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1288/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් අතරින් මේ වනවිට තාක්ෂණික විෂය ධාරාව ඉගැන්වීමේ කටයුතු සිදු කරනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් අතර තාක්ෂණික විෂය ධාරාව ප්‍රචලිත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1706/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය සතු කෘෂිකාර්මික ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොවිපළ සතු මුළු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) මේ වනවිට එම මුළු ඉඩම් ප්‍රමාණය කෘෂිකාර්මික කටයුතු සඳහා ඵලදායී ලෙස භාවිත කර තිබේද;

(iv) ඵලදායී ලෙස භාවිත කර නොමැති ඉඩම්, කෘෂිකාර්මික කටයුතු සඳහා පෞද්ගලික ව්‍යවසායකයන්ට තාවකාලික පදනම මත ලබා දෙන්නේද;

(v) එසේ නම්, එලෙස ලබා දිය හැකි ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1732/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පවතින පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පීඨවල නම් කවරේද;

(iii) එම එක් එක් පීඨයේ උගන්වනු ලබන පාඨමාලා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විශ්වවිද්‍යාලය සඳහා අනුමත කර ඇති ඉංජිනේරු පීඨයේ ඉගැන්වීමට නියමිත පාඨමාලා කවරේද;

(ii) එම ඉංජිනේරු පීඨය පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(iii) එසේ නම්, එම ඉංජිනේරු පීඨය ඉදිකිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1746/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) එම එක් එක් වී ගබඩාවේ ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2015 සිට මේ දක්වා එම එක් එක් ගබඩාවේ ගබඩා කරන ලද වී ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් කවරේද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) එම වී ගබඩා නැවත සක්‍රීය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද,

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1755/2024

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුලී නිවාසවල පදිංචි වී සිටින පදිංචිකරුවන්ට ඉඩමේ අයිතිය තහවුරු කිරීමට නොහැකි වීම සහ සිය නමට ලබා ගන්නා ලද ජල බිල්පත්/විදුලි බිල්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුවෙන් ඔවුන්ගේ දරුවන් රජයේ පාසල්වලට ඇතුළත් කිරීමේදී සහ ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමේදී ඔවුන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1880/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන මාරු ප්‍රතිපත්තියේ අඩංගු ප්‍රධාන කරුණු හා නිර්ණායක කවරේද;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(iv) එසේ නම්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2020/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමතිය සහිතව පවත්වාගෙන යනු ලැබූ සීමාසහිත එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (ETI) ආයතනය 2018 වර්ෂයේ මුල් භාගයේදී සිය ව්‍යාපාර කටයුතු නවතා දැමීම හේතුවෙන් එම ආයතනයේ ගනුදෙනුකරුවන් අපහසුතාවයට පත් වූ බව දන්නේද;

(ii) 2023 වර්ෂයේ අග භාගයේදී එම ආයතනය ඈවර කිරීමට අධිකරණය තීන්දු කිරීමෙන් පසු එම ආයතනය සතුව පැවති වත්කම්වල වටිනාකම කොපමණද;

(iii) ඒ අතරින් එම ආයතනයේ තැන්පත්කරුවන්ට ගෙවීම සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) එම මුදල් ගෙවනු ලබන නිශ්චිත දිනයක් තීරණය කර තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි අවස්ථාවකදී සමාගමක හිමිකරුවන්ට සමාගම් පනත යටතේ ඒ සම්බන්ධයෙන් ඇති වගකීම් කවරේද;

(ii) ඉහත ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2024 සැප්තැම්බර් 04 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1922/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට රබර් වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ වාර්ෂික ෂීට් රබර් නිෂ්පාදනය කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ වාර්ෂික රබර් අපනයන ආදායම කොපමණද;

(v) ඉදිරියේදී අලුතින් රබර් වගාව ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1946/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගෘහස්ථ කම්කරුවන් ලෙස සේවය කරනු ලබන පුද්ගලයන්ගේ තොරතුරු කම්කරු දෙපාර්තමේන්තුව සතුව පවතින්නේද;

(ii) එසේ නම්, මේ වනවිට ශ්‍රී ලංකාවේ සේවය කරනු ලබන ගෘහස්ථ කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1974/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉතාම වේගයෙන් ඛාදනයට ලක් වන වෙරළ කලාප කවරේද;

(ii) ඛාදනයට ලක් වූ වෙරළ කලාප අතරින් මේ වනවිට සංරක්ෂණය කර ඇති වෙරළ කලාප සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට සංරක්ෂණය කරමින් පවතින වෙරළ කලාප කවරේද;

(iv) වර්ෂ 2019 සිට මේ දක්වා වෙරළ සංරක්ෂණ ව්‍යාපෘති වෙනුවෙන් වැය කරන ලද මුළු මුදල කොපමණද;

(v) වෙරළ සංරක්ෂණ ව්‍යාපෘති සඳහා විදේශීය ණය මාර්ගයෙන් සපයා ගන්නා ලද මුදල, ඉහත සඳහන් මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1997/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අරමුදල්, ප්‍රධාන වශයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ අවශ්‍යතා සඳහා වියදම් කිරීමට අදාළ විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයා උත්සාහ දරන බවත්;

(ii) ඒ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා එකඟ වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම තත්ත්වය තුළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉවත් කර එම තනතුර සඳහා වෙනත් පුද්ගලයකු පත් කර ගැනීමට කටයුතු කරමින් තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2140/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොල්ෆ් ක්‍රීඩාංගන, ගොල්ෆ් රිසෝට්, විලා 600ක්, ජාත්‍යන්තර රෝහලක්, ආයුර්වේද රෝහලක්, තරු පහේ හෝටල් 02ක් සහ උද්භිද උද්‍යානයකින් සමන්විත ඇල්ෆා ඇන්ඩ් ඔමේගා ඩිවලොපර්ස් (පුද්ගලික) සමාගම විසින් බෙරගල ක්‍රියාත්මක කරන Hidden Valley Eco Golf Resort ව්‍යාපෘතියට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමතිය ඇති බවත්;

(ii) ඒ වෙනුවෙන් හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සොරගුණේ කුඩා කතරගම දේවාලයේ අක්කර 628ක ඉඩමක් මිලට ගෙන ඇති අතර ඒ සඳහා එවකට සිටි බස්නායක නිලමේවරුන් සහ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ ලිපි සහිත නීත්‍යානුකූල ඔප්පු, පත්ඉරු, පිඹුරුපත් හා දේවාල රාජකාරි සන්නස ඇතුළු ලිපි ලේඛන ඇති බවත්;

(iii) එසේ වුවද, ඉහත ව්‍යාපෘතියට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අනුමතිය සහ ඉහත දේවාලයේ වර්තමාන නිලමේවරයා සහ පෙර නිලමේවරුන් එකඟතාවය ලබා දී නොමැති බැවින් ඉහත ව්‍යාපෘතිය ආරම්භ කිරීම වසර හතක් පමණ ප්‍රමාද වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට ඉහත ව්‍යාපෘතියට ඇමෙරිකානු ඩොලර් මිලියන 30ක් පමණ වැය කර ඇති බැවින් එය කඩිනමින් ආරම්භ කිරීමට අනුමතිය ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 සැප්තැම්බර් 05 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

7/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසුන් සංඛ්‍යාව විද්‍යා, ගණිත, වාණිජ සහ කලා යන විෂය ධාරා අනුව ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මහනුවර දිස්ත්‍රික්කයේ බහුතර සිසුන් සංඛ්‍යාවක් අ.පො.ස (උ.පෙළ) විද්‍යා හෝ ගණිත විෂය ධාරාව වෙත යොමු කරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

46/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුවන්පුර අධිවේගී මාර්ගය බදුල්ල දක්වා දීර්ඝ කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් සපයා ගනු ලබන මූලාශ්‍ර කවරේද;

(iv) ඊට අදාළ ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(v) එම ඉදිකිරීම් අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රුවන්පුර අධිවේගී මාර්ගය බදුල්ල දක්වා දීර්ඝ කිරීමේදී එම ප්‍රදේශවල පරිසර පද්ධතියට සිදු වන හානිය සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ඇගයීම සිදු කරන ලද ආයතනය කවරේද;

(iii) පරිසර හානි අවම වන ලෙස ඊට අදාළ ඉදිකිරීම් සිදු කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2013/2024

ගරු මයන්ත දිසානායක මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර නගරය සංවර්ධනය කිරීම සඳහා නගරය අවට ඉඩම් රජයට පවරා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්වල හිමිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) පවරා ගන්නා ලද එම ඉඩම් සඳහා වන්දි ලබා දී තිබේද;

(v) එසේ නම්, ලබා දෙන ලද මුළු වන්දි මුදල කොපමණද;

(vi) එම වන්දි මුදල එක් එක් ඉඩම් හිමිකරුවා අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2027/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ —

(i) වර්ෂ 2019 සිට 2023 දක්වා ඉදිකරන ලද අලිවැටවල දිග ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

(ii) ඉදිරියේදී ඉදිකිරීමට සැලසුම් කර ඇති අලිවැටවල දිග;

කිලෝමීටර්වලින් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2049/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීත්‍යානුකූල සුරාබදු බලපත්‍ර නිකුත් කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති නීත්‍යානුකූල ර.බී. 04 සුරාසල් සංඛ්‍යාව සහ බියර් අලෙවිසැල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2023 වර්ෂයේදී නිකුත් කර ඇති ර.බී. 04 සුරාබදු බලපත්‍ර, බියර් බලපත්‍ර හා සුරාබදු අයදුම්පත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ර.බී. 04 සුරාබද්ධ බලපත්‍රය, බියර් බලපත්‍රය හා සුරාබද්ධ අයදුම්පත්‍රය නිකුත් කරන ලද පුද්ගලයාගේ හෝ සමාගමේ / ආයතනයේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2023 වර්ෂයේදී අනුමතිය ලබා දී ඇති සුරාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා ලබා දී ඇති සුරාබද්ධ බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) මේ දක්වා පැවති කිසිදු රජයක් බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා ර.බී. 04 සුරාබද්ධ බලපත්‍රයක් නිකුත් කර නොමැති බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2060/2024

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපළක්, තෙල්දෙණිය-මාබෙරිතැන්න ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති බව දන්නේද;

(ii) ඉහත සඳහන් ගොවිපළේ පදිංචි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගොවිපළේ ඇති කම්කරු නිවාස, පේළි නිවාස සහ තාවකාලික නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගොවිපළේ පේළි නිවාසවල පදිංචිකරුවන් සඳහා තනි නිවාස ඉදිකර දීමට අවශ්‍ය ඉඩම් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබූ බව දන්නේද;

(ii) එම තීරණය අනුව ඉඩම් ලබා දීම මේ දක්වා ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2089/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති පෞද්ගලික විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදුලි බලාගාරයේ නම හා හිමිකරුවාගේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් විදුලි බලාගාරයෙන් මිලට ගන්නා ලද විදුලි ඒකක සංඛ්‍යාව සහ ඒ වෙනුවෙන් ගෙවන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික විදුලි බලාගාරවලින් විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන් අත්සන් කර ඇති ගිවිසුම්වල කොන්දේසි ලංකා විදුලිබල මණ්ඩලයට අහිතකර බව දන්නේද;

(ii) පෞද්ගලික විදුලි බලාගාරවලින් විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන් නව සූත්‍රයක් හඳුන්වා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධ විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2106/2024

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති පිළිගත් පෞද්ගලික විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) එම එක් එක් විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව, එම පීඨවල නම්, පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව හා එම පාඨමාලාවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම විශ්වවිද්‍යාල අධීක්ෂණය හා නියාමනය කිරීම සඳහා පවතින ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2156/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ඒ' ශ්‍රේණියේ මූලික රෝහලක් වන පුත්තලම රෝහලේ බාහිර රෝගී අංශයේ, නේවාසික රෝගී අංශයේ සහ විවිධ සායන සඳහා පැමිණෙන රෝගීන් සඳහා පවතින මූලික අවශ්‍යතා සහ ඉඩකඩ ප්‍රමාණවත් නොමැති බවත්;

(ii) එම රෝහල සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති අතර වෛද්‍ය, සංවර්ධන නිලධාරි, උපස්ථායක, බන්තුරේඛන ශිල්පී, වාට්ටු ලිපිකරු, ජලනල කාර්මික, මැහුම් සේවිකා, සුළු සේවා පාලක, අරක්කැමි, දුරකථන ක්‍රියාකරු, පෙදරේරු, වඩු කාර්මික සහ රියදුරු යන තනතුරුවල පුරප්පාඩු පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම රෝහලේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට සහ ඉහත සඳහන් පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2157/2024

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර විද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාරය ඇතුළු ගොඩනැගිලි පවරාගෙන එම විද්‍යාලයට අයත් භූමියක කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය සහ කළුතර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය පිහිටුවා ඇති බවත්;

(ii) විද්‍යාලයේ අවශ්‍යතාවයන් සඳහා ඉහත භූමිය හා ගොඩනැගිලි ආපසු ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීම පරිදි 1990.10.15 වැනි දින ගොඩනැගිලිවලින් කොටසක් කළුතර විද්‍යාලය වෙත ආපසු භාර දුන් බවත්;

(iii) පළාත් රාජ්‍ය ආයතන එක් ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීමේ සැලසුම අනුව කළුතර උතුර, ශ්‍රී සුමංගල පාරේ ඉදිකරන ලද මහල් ගොඩනැගිල්ලක අනෙකුත් කාර්යාල ස්ථාපනය කර තිබුණද එහි අධ්‍යාපන කාර්යාල පමණක් මේ වනතෙක් ස්ථාපනය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් අධ්‍යාපන කාර්යාල දෙක උක්ත මහල් ගොඩනැගිල්ලේ ස්ථාපනය නොකිරීමට හේතු කවරේද;

(ii) ඒවා ඉහත ගොඩනැගිල්ලේ ස්ථාපනය කරන්නේද;

(iii) එසේ නම්, එම දින වකවානු කවරේද;

(iv) නොඑසේ නම්, එම කාර්යාල වෙනත් ගොඩනැගිල්ලක ස්ථාපනය කරන්නේද;

(v) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 සැප්තැම්බර් 06 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

314/2024

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ පවතින දිස්ත්‍රික් ක්‍රිකට් ක්‍රීඩා සංගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් සංගමයේ සේවයේ නියුතු නිලධාරින් සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවකයන්ගේ වැටුප්තල හා දිස්ත්‍රික් ක්‍රිකට් ක්‍රීඩා සංගම්වල සේවකයන්ගේ වැටුප්තල අතර විෂමතාවයක් පවතින බව දන්නේද;

(v) එසේ නම්, එම විෂමතාවය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

360/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති පෙර පාසල් (පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන);

(ii) පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය හා රාජ්‍ය අනුබද්ධිත යන වර්ගීකරණය යටතේ ක්‍රියාත්මක වන පෙර පාසල්;

(iii) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය යටතේ අධ්‍යාපනය ලබා දෙන පෙර පාසල්;

(iv) පෙර පාසල් අධ්‍යාපනය ලබන දරුවන්;

(v) පෙර පාසල් අධ්‍යාපනය නොලබන වයස අවුරුදු 3-5 අතර දරුවන්;

(vi) පෙර පාසල් පාලක පාලිකාවන්;

සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දරුවන් පෙර පාසල් අධ්‍යාපනය නොලැබීමට බලපා ඇති හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මුළු පෙර පාසල් ගුරුවරුන් සංඛ්‍යාව, ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පූර්ව ළමාවිය අධ්‍යාපන ඩිප්ලෝමාධාරි ගුරුවරුන් සංඛ්‍යාව, මුළු පෙර පාසල් ගුරුවරුන්ගේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) පෙර පාසල් සඳහා පොදු විෂය නිර්දේශයක්/පොදු පාඨමාලාවක් සහ පෙර පාසල් ගුරුවරුන් සඳහා ගුරු අත්පොතක් තිබේද;

(iv) පෙර පාසල් නියාමනය කිරීමට ක්‍රමවේදයක් තිබේද;

(v) නොඑසේ නම්, ඒවා ක්‍රියාත්මක වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

376/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන ආයුර්වේද මහ රෝහල්, දිස්ත්‍රික් ආයුර්වේද රෝහල්, ග්‍රාමීය ආයුර්වේද රෝහල්, ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා සහ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල සංඛ්‍යාව, ඒවායේ නම් සහ පිහිටුවා ඇති ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

383/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත කන්තලේ සීනි සමාගම ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම කර්මාන්තශාලාව ක්‍රියාත්මකව පැවැති කාලයේදී වාර්ෂිකව නිෂ්පාදනය කරන ලද සීනි ප්‍රමාණය සහ ස්ප්‍රීතු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කර්මාන්තශාලාව වසා දමන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසා දැමීමෙන් පසු එම කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගතකරණය සඳහා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ ආයතනය/ආයතන කවරේද;

(iii) ඒ අතරින් තෝරාගන්නා ලද ආයතනය කවරේද;

(iv) මේ වනවිට එම සීනි කර්මාන්තශාලාවේ තත්ත්වය කවරේද;

(v) එම කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

468/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ඖෂධ ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලයේදී විවිධ හේතු නිසා භාවිතයෙන් ඉවත් කරන ලද ඖෂධ සංඛ්‍යාව සහ එම ඖෂධවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඖෂධ, භාවිතයෙන් ඉවත් කිරීමට බලපාන ලද හේතු සාධක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඖෂධ ගබඩා කිරීම සම්බන්ධයෙන් විගණන වාර්තාවේ දක්වා ඇති විමසුම් කවරේද;

(ii) එම විගණන විමසුම් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

514/2024

ගරු රෝහණ බංඩාර මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර, පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්කිරියාගම පොලිස් බලප්‍රදේශයේ "හුරුල්ලැව" නමින් පුරාවිද්‍යා ස්ථානයක් පවතින බවත්;

(ii) පසුගිය කාලයේදී එම පුරාවිද්‍යා ස්ථානය කිසියම් පිරිසක් විසින් ඩෝසර් කර විනාශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම විනාශ කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

545/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රචාරණ කටයුතු සිදු කරන ලද එක් එක් ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාලය තුළ මණ්ඩලය විසින් ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ප්‍රචාරණ කටයුතු සඳහා ආයතනයක් තෝරා ගැනීමේදී මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iv) ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කරනු ලබන මුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) ප්‍රචාරණ කටයුතුවලින් පසු වර්ෂ 2019 සිට මේ දක්වා මණ්ඩලයේ ලොතරැයි පත් අලෙවියේ සිදු වූ වර්ධනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

567/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ භාවිත වන ඉඩම් ඔප්පු වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඔප්පු වර්ගවල නම් කවරේද;

(iii) රජයේ ඉඩම් නියමානුකූල කිරීම යටතේ වර්ෂ 2019 සිට මේ දක්වා ලබා දී ඇති ඉඩම් ඔප්පු සංඛ්‍යාව සහ ඉදිරියේදී ලබා දීමට නියමිත ඉඩම් ඔප්පු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී ලබා දීමට නියමිත ඉඩම් ඔප්පු ලබා දීමට නියමිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

598/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2017 සිට 2021 දක්වා විදේශ ගත වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් වර්ෂය අවසානය වනවිට විදේශ ගතව සිටි මුළු ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2020 හා 2021 වර්ෂවලදී නැවත ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2017 සිට 2021 දක්වා විදේශ ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විසින් මෙරටට එවන ලද විදේශ විනිමය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව ඇමෙරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළදී ඔවුන් විසින් එවන ලද විදේශ විනිමය ප්‍රමාණයෙහි සිදු වූ අඩුවීම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් විසින් මෙරටට එවන ලද විදේශ විනිමය ප්‍රමාණය අඩුවීමට බලපාන ලද විශේෂ හේතුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

612/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1978 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ රජය සතුව පැවති රාජ්‍ය සංස්ථා, අධිකාරි, මණ්ඩල සහ වෙනත් නිෂ්පාදන හා සේවා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම සහ කරන ලද නිෂ්පාදනය/සපයන ලද සේවාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i)හි සඳහන් ආයතන අතරින් මේ වනවිට ක්‍රියාත්මක වන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් ආයතනයේ රජයේ හිමිකාරීත්වය ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) සඳහන් නිෂ්පාදන/සේවා ආයතනයන්ගෙන් පෞද්ගලීකරණය කර ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම, කරන ලද නිෂ්පාදනය/සපයන ලද සේවාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (අ)(i) සඳහන් ආයතන අතරින් මේ වනවිට බංකොලොත් වී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?